මාධ්‍ය ප්‍රකාශය: 2008 මැයි **15**

# 2048දී ශ්‍රී ලංකාව:

## තිරසාර අනාගතයක් සඳහා ටෙලිවිෂන් සංවාද මාලාවක්!

ශ්‍රී ලංකාව නිදහස ලබා සියවසක් සපුරන 2048 වන විට අපේ දිවයිනේ පරිසර තත්ත්වය කෙසේ විය හැකිද?

ජලය හා වාතය දූෂණය වීමෙන් දහස් ගණනක් දෙනා ලෙඩ වන්නට හා මිය යන්නට දිගටම ඉඩ දිය යුතුද?

සොබා සම්පත් හා පිවිතුරු වටපිටාව වනසා නොගෙන ආර්ථික වශයෙන් දියුණු වීමට ශ්‍රී ලංකාව ගත යුතු පියවර හා ක්‍රමෝපායන් කවරේද?

දේශගුණ විපර්යාස හමුවේ උග්‍ර වෙමින් පවතින ආපදාවලින් අපේ දිවයින රැකගන්නේ කෙසේද?

මේ සියවසේදී ශ්‍රී ලංකාවට තිරසාර අනාගතයක් ළඟා කර ගන්නට තනි තනිව හා සාමූහිකව අපට කළ හැකි දේ ගැන නව ආකාරයකින් ගවේෂණය කරන සංවාද මාලාවක් මැයි 22දා සිට සෑම බ්‍රහස්පතින්දාම රාත්‍රී 10.45ට සිරස TV ඔස්සේ විකාශය වේ.

මැදිරියක් තුළ සිදුවන සංවාදයක ස්වරූපයෙන් ඉදිරිපත් කෙරෙන මේ වැඩසටහන් මාලාවට සංවාද මඬුල්ලක් හා සක්‍රීය ලෙස සහභාගී වන ප්‍රේක්ෂක පිරිසක් සම්බන්ධ වෙති. සෑම සතියකම, ජන ජීවිතයට අද මෙන්ම අනාගතයේදීත් දැඩි සේ බලපාන පාරිසරික හෝ සංවර්ධන ප්‍රශ්නයක් මේ කථාබහ ඔස්සේ විවාදයට ලක් වේ. එය නම් කෙරෙන්නේ 2048දී ශ්‍රී ලංකාව වශයෙනි.

සිරස මාධ්‍ය ජාලය සමග මේ සංවාද මාලාව නිෂ්පාදනය කරන්නේ ටීවීඊ ඒෂියා පැසිෆික් (TVE Asia Pacific) අධ්‍යාපන මාධ්‍ය පදනම සහ ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ ජාත්‍යාන්තර සංගමය හෙවත් IUCN ආයතනයයි.

තිරසාර සංවර්ධනය වඩාත් පුළුල් ලෙසින් විග්‍රහ කරමින් තේමා සහ විෂයන් රැසක් ඔස්සේ අනාගතය ගැන මෙනෙහි කරන්නට මේ සංවාද මාලාව උත්සාහ කරයි. ඒ සඳහා රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, ජන සංවිධාන මෙන්ම සරසවි ඇදුරන් හා වෙනත් විද්වතුන් ද සම්බන්ධ කර ගැනේ.

ශ්‍රී ලංකා රජය, රාජ්‍ය ආයතන හා ජන සංවිධාන ගණනාවක් සාමාජිකත්වය දරණ IUCN ආයතනයට කාලීන ප්‍රශ්න පිළිබඳව මැදිහත්ව, විද්‍යාත්මකව කතාබහ කිරීමට සියළු පාර්ශවයන් එක්තැන් කරන කැඳවුම්කරු හැටියට ක්‍රියාකළ හැකියැයි IUCN ශ්‍රී ලංකා කාර්යාලයේ ප්‍රධානී ආචාර්ය රංජිත් මහින්දපාල මහතා ප්‍රකාශ කරයි.

ටීවීඊ ඒෂියා පැසිෆික් ආයතනය සමගින් මේ සංවාද මාලාව නිෂ්පාදනය කර විකාශය කිරීමට හැකි වීම ගැන සිරස TV හා චැනල් වන් MTV නාලිකා බෙහෙවින් සතුටු වන බව සිරස මාධ්‍ය ජාලයේ අධ්‍යක්ෂ මනෝ වික්‍රමනායක මහතා ප්‍රකාශ කරයි. මේ අත්දැකීම මත ඉදිරියේදී මහජනයාට අදාළ තවත් මාතෘකා හා තේමා ගැන සංවාද කළ හැකි වනු ඇතැයි ද ඔහු කියා සිටී.

2008 මැයි 22 සිට සෑම බ්‍රහස්පතින්දාකම රාත්‍රී 10.45ට
සිරස TV ඔස්සේ.

**Channel One MTV**
සඳහා විකාශ දින සහ වේලාවන් තවම තීරණය කර නොමැත.

TVE Asia Pacific

සහ

MTV Channel (Pvt) Limited

සම නිෂ්පාදනයකි

අනුග්‍රහය:

ස්වභාවික සම්පත් සංරක්ෂණය සඳහා වන ජාත්‍යාන්තර සංගමය

On Sirasa TV:
Thursdays
at 10.45 pm

Co-produced by:
TVE Asia Pacific

and
MTV Channel (Pvt) Limited

In partnership with:

International Union for Conservation of Nature

Supported under the Raising Environmental Consciousness in Society (RECS) Project sponsored by the Government of the Netherlands.

2048දී ශ්‍රී ලංකාව සංවාද මාලාව උත්සාහ කරන්නේ තිරසාර සංවර්ධනය පිළිබඳ කලක් තිස්සේ සිදු වන කථා බහ හුදෙක් පාරිසරික ප්‍රශ්නවලින් ඔබ්බට ගෙන යෑම බව ටීවීඊ ඒෂියා පැසිෆික් ආයතනයේ අධ්‍යක්ෂ නාලක ගුණවර්ධන කියයි.

"මේ කථාබහ හරිත පරාසයකට කොටු වී සිටියා ඇති, සොබා සම්පත් නොනසා, හැමට ම වැඩි ආදායම් හා වඩාත් හොඳ ජීවන මට්ටමක් ලබා දිය හැක්කේ කෙසේද යන බරපතළ අභියෝගය හරිත කෝණයට වඩා පුළුල්ව විග්‍රහ කිරීම අවශ්‍යයි," ඔහු ප්‍රකාශ කරයි.

කැලිකසළ ප්‍රශ්නය, වායු දූෂණය, ගොඩබිම් හා සාගරයේ ජෛව සම්පත් සුරැකීම, ආපදාවලින් වන හානි අවම කර ගැනීම ආදී තේමාවන් ගණනාවක් ඔස්සේ සංවාද ගොඩ නැගෙනු ඇත. පැයක් පුරා දිවෙන එක සංවාදයකට සිව් දෙනෙකුගෙන් යුත් සංවාද මඬුල්ලක් හා 24 දෙනෙකුගෙන් සමන්විත සක්‍රීය ප්‍රේක්ෂක පිරිසක් සහභාගී වෙති.

සිරස මාධ්‍යවේදී කිංස්ලි රත්නායක මෙහෙයවන මේ සංවාද මාලාව නව රටාවකට ඉදිරිපත් කෙරෙනු ඇත. සංවාද මඬුල්ලට අමතරව ප්‍රේක්ෂකයන් බහුතරයකට ද අදහස් දැක්වීමේ අවස්ථා රැසක් හිමි වේ. ඊට අමතරව කල් තබා සූදානම් කරගත් කෙටි වීඩියෝ වාර්තා ඔස්සේ මෙරට හා ආසියානු රටවල මේ අභියෝගවලට මුහුණ දෙමින් ජන සංවිධාන, පර්යේෂණ ආයතන හා සමාගම් ගෙන ඇති පියවර කෙටියෙන් හඳුන්වා දෙනු ලබයි.

මේ සංවාද මාලාව නෙදර්ලන්ත රජයේ ආධාර මත IUCN Sri Lanka මගින් ක්‍රියාත්මක වන Raising Environmental Consciousness in Society (RECS) ව්‍යාපෘතියේ කොටසකි.

**අපව අමතන්න...**

TVE Asia Pacific
ජ්‍යෙෂ්ඨ නිෂ්පාදිකා: පමුදි විතානාරච්චි
<pamudi@tveap.org>

සහය නිෂ්පාදනය:

- විපුල දහනායක
- බුද්ධිනී ඒකනායක

**TVEAP දුරකථන:**
011 4412 195